# සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය

## ප්‍රාසංගික කලාවේදී (විශේෂ) උපාධි දෙවන වසර පරීක්ෂණය - 2018/2019

## සංගීත පීඨය

## MUEM 21012 - මානවවංශ සංගීත ඉතිහාසය හා සිද්ධාන්ත

කාලය :- පැ 02

සැ.යු :- පිළිතුරු ලිවීම ආරම්භ කිරීමට පෙර දී ඇති උපදෙස් හොඳින් කියවන්න.

---

- ❖ මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න අටකින් (08) සමන්විත වේ.
- ❖ ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.
- ❖ සෑම ප්‍රශ්නයක් සඳහාම පිළිතුරු අලුත් පිටුවකින් ආරම්භ කරන්න.
- ❖ සෑම ප්‍රශ්නයක් සඳහාම සමාන ලකුණු ලැබේ.

---

1. දේශීය ජන ගී වර්ගීකරණය පිළිබඳව කෙටියෙන් හඳුන්වා, "ප්‍රබන්ධ ආකෘතිය අනුව වර්ගීකරණය" යන්න විස්තර කරන්න.

2. දේශීය තිත් ක්‍රමය හඳුන්වා එහි ප්‍රභේද විස්තර කරන්න.

3. පහත නම් සඳහන් විද්වතුන් අතුරින් දෙදෙනකු තෝරාගෙන, ඔවුන් විසින් විෂය ක්ෂේත්‍රයේ උන්නතිය වෙනුවෙන් සිදුකරන ලද කාර්යභාරය විස්තර කරන්න.
   - i. ඩබ්ලිව්.බී. මකුලොලුව
   - ii. සී.ද.ඇස්. කුලතිලක
   - iii. බෙලා බාටොක්

4. පහත සඳහන් මාතෘකා අතුරින් තුනක් (03) පිළිබඳ කෙටි සටහන් ලියන්න.
   - i. ඡන්දස්
   - ii. විරිත්
   - iii. වර්ණ
   - iv. අක්ෂර
   - v. මාත්‍රා

5. මානවවංශ සංගීතවිද්‍යා විෂය ප්‍රභවය වීමෙහිලා උපස්තම්භක වූ සමාජ, දේශපාලන සහ ආර්ථික සාධක කවරේදැයි විමසන්න.

6. පහත දැක්වෙන පාරිභාෂිත පද විස්තර කරන්න.
   - i. සින්දු
   - ii. අෂ්ටක
   - iii. සන්න
   - iv. ශ්ලෝක

7. දේශීය අවනද්ධ භාණ්ඩයන්හි ඉතිහාසය පිළිබඳව ඓතිහාසික මූලාශ්‍රය ඇසුරින් විමසන්න.

8. "යම් රටක ජාතික සංගීතයක් ගොඩනැගීමෙහිලා එරට ජන සංගීතය උපස්ථම්භක වේ." මෙම ප්‍රකාශය පිළිබඳව ඔබේ අදහස් දක්වන්න.

::::::::::::::::::::::::::::::

2021.11.08